# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2080/28 - 2018 ජූලි මස 16 වැනි සඳුදා - 2018.07.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ සේවා ව්‍යවස්ථාව**

දෙවන සංශෝධනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1986/2 දරණ හා 2016.09.26 වැනි දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එම්.ඒ.බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2018 ජූලි මස 12 වැනි දින.


1A - G 28106— 08 (2018/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| අනු අංකය | ඡේද අංකය | සංශෝධනය වන ආකාරය |
|---|---|---|
| 01. | 13. අන්තර්කාලීන විධිවිධාන යටතේ 13.4 | මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට වසර පහක (05) කාලයක් සම්පූර්ණ වන 2021.09.26 දිනය දක්වා, ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු තනතුරට බඳවා ගැනීමේදී මෙම සේවා ව්‍යවස්ථාවේ 7.2.3.2.1 යටතේ සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් වෙනුවට අංක 1009 දරණ හා 1998 ජනවාරි 02 දිනැති ගැසට් පත්‍රය මඟින් පළකරන ලද ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ සේවා ව්‍යවස්ථාවේ 7.1 යටතේ සඳහන් සුදුසුකම් අදාළ කරගනු ලැබේ.<br><br>සටහන:- මෙම සේවා ව්‍යවස්ථාවේ 7.2.3.2.1 (ii) යටතේ සඳහන් වන තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ - 06) මට්ටමේ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික ඩිප්ලෝමාවක් සම්පූර්ණ කර තිබීම යන සුදුසුකම රහිතව 13.4 යටතේ සඳහන් අන්තර්කාලීන විධිවිධාන අනුව ක්‍රීඩා පුහුණුකරු තනතුරට පත්වන නිලධාරීන්<br><br>(අ). තනතුරට පත්වී වසර පහ (05) ක් සම්පූර්ණවීමට පෙර මෙම සේවා ව්‍යවස්ථාවේ 7.2.3.2.1 (ii) යටතේ සඳහන් සුදුසුකම සම්පූර්ණ කළ යුතුය.<br><br>(ආ) ඉහත (අ) පරිදි සුදුසුකම සම්පූර්ණ නොකරන නිලධාරීන්ගේ වැටුප් වර්ධක වසර පහ (05)ක සේවා කාලය සම්පූර්ණ කල දින සිට 7.2.3.2.1 (ii)යටතේ සඳහන් සුදුසුකම සම්පූර්ණ කරන දිනය දක්වා විලම්භනය කරනු ලැබේ. |
| | 13.5 | මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට වසර 02ක කාලයක් එනම් 2018.09.26 දින දක්වා ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ විධායක සේවා ගණයේ II ශ්‍රේණියේ වසර පහ (05)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර වැටුප් වර්ධක පහ (05)ක් උපයාගෙන ඇති සහ අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුලම සතුටු දායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇති නිලධාරීන් 10.6.1.1. (i) හා (ii) හි සඳහන් සුදුසුකම් නොසලකා විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විධායක සේවා ගණයේ I ශ්‍රේණියට උසස් කරනු ලැබේ. |

08 - 70

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.